# තනතුරු ඇබෑර්තු

## සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය

පහත සඳහන් තනතුරු වෙනුවෙන් වර්ෂයක පුහුණුවක් සඳහා අයදුම්පත්‍ර කැඳවනු ලැබේ. තමත් විසින් පිළියෙල කරන ලද අයදුම් පත්‍රයක් 2023-08-21 දිනට පෙර සියලුම අධ්‍යාපන හා පුහුණු හා සේවා සහතිකවල පිටපත් සමග පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළයුතුය.

**තනතුර** : **කළමනාකරණ සහකාර - පන්තිය III (පුහුණු කිරීම සඳහා)**

**වැටුප් පරිමාණය** : 19,050-180X10-200X10=22,850

**වයස් සීමාව** : අවුරුදු 18 - 45 අතර විය යුතුය.

**අධ්‍යාපන සුදුසුකම්**

1. අ.පො.ස. උ/පෙළ සාමාර්ථය සමග දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස සා/පෙළ ගණිතය, භාෂාව හා ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 04 කට සම්මාන තිබීම.

   හෝ

2. ගණිතය, භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් 05 කට සම්මාන සහිතව අ.පො.ස. සා/පෙළ සමත්වීම සහ ජාතික සමුපකාර මණ්ඩලය විසින් පිරිනමනු ලබන සමුපකාර සංවර්ධන සා/පෙළ සාමාර්ථය සමග පිළිගත් වාණිජ කාර්මික ආයතනයක කාර්යාල කටයුතු පිළිබඳ වසරක පළපුරුද්ද.

   හෝ

3. කාර්යාල කළමනාකරණ විෂයයට සම්මාන සහිතව ජාතික සමුපකාර මණ්ඩලය විසින් පිරිනමනු ලබන සමුපකාර සංවර්ධන සා/පෙළ සාමාර්ථය සමග පිළිගත් වාණිජ කාර්මික ආයතනයක කාර්යාල කටයුතු පිළිබඳ වසර 02 කට නොඅඩු පළපුරුද්ද.

   හෝ

4. කාර්යාල කාර්ය සහායක තනතුරේ 1 වන පන්තියේ වසර 05 ක පළපුරුද්ද.

**තනතුර** : **කාර්යාල කාර්ය සහායක - පන්තිය III (පුහුණු කිරීම සඳහා)**

**වැටුප් පරිමාණ** : 16,100-140X10-150X10=19,000

**වයස් සීමාව** : අවුරුදු 18 - 45 අතර විය යුතුය.

**අධ්‍යාපන සුදුසුකම්**

1. දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය සහ භාෂාවට සාමාර්ථ සමග අ.පො.ස. සා/පෙළ විෂයයන් 06 කින් සමත්වීම.

සැ.යු. - වසරක සේවා කාලය තුළ දීමනාවක් පමණක් ගෙවන අතර, එම පුහුණු කාලය සාර්ථකව අවසන් කළපසුව සමුපකාර සේවක ආයතන සංග්‍රහය අනුව ස්ථිර සේවයට බඳවාගැනීම කෙරෙහි සලකා බලනු ලැබේ.

**සාමාන්‍යාධිකාරී,**
**සී/ස සෞඛ්‍ය සේවා මුදල් ඉතිරි කිරීමේ සහ ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය.**
**912/1, මරදාන පාර, කොළඹ 08.**

2023-07-27